# ඉගෙනුම් අත්වැල
# නාට්‍ය හා රංග කලාව

## 11 ශ්‍රේණිය - 3 වාරය



සෞන්දර්ය අංශය
අධ්‍යාපන අමාත්‍යාංශය
ඉසුරුපාය
බත්තරමුල්ල

# 06-11 නාට්‍ය හා රංග කලාව විෂය ස්වයං අධ්‍යයන අත්වැල සම්පාදක කණ්ඩායම

අචිනි නයන්තරා මෙය - ගුරු වෘත්තික - ච/ගල්/ඇහැටුවැව බණ්ඩාරනායක ම. වි. මහව.

අශෝක චන්ද්‍රසේකර මයා - ගුරු වෘත්තික - ච/නික/සංඝබෝධි ම. ම. වි. අවුලේගම.

ඉන්දු මැණිකේ මිය - ගුරු වෘත්තික - ච/හලා/ධම්මිස්සර ජා. පා. නාත්තණ්ඩිය.

ගයාන් රන්දීර මයා - ගුරු වෘත්තික - බප/මිනු/සෙනරත් පරණවිතාන ජා. පා, උඩුගම්පොල.

ගාමිණී බස්නායක මයා - ගුරු වෘත්තික - අම්/මහ/මිරිස්වත්ත ද්වි.පා. පදියතලාව.

ජයනි කපුගේ මිය - ගුරු වෘත්තික - බප/කො/සිරිමාවෝ බණ්ඩාරනායක විද්‍යාලය, කොළඹ 07.

මහේෂා විජේසිංහ මිය - ගුරු වෘත්තික - මප/ගම්/ශා. ජෝශප් බා.වි. ගම්පොල.

රසිකා රත්නායක මිය - ගුරු වෘත්තික - බප/කො/ක්ලිෆ්ටන් බා. වි. කොළඹ 10.

රංගන වන්නකුආරච්චි මයා - ගුරු වෘත්තික - බප/ගම්/බණ්ඩාරනායක ජා. පා. ගම්පහ.

ලලිත අතාවුද මයා - ගුරු වෘත්තික - බප/ජය/සුභූති ජා. පා. බත්තරමුල්ල.

වරුණ අලහකෝන් මයා - නියෝජ්‍ය අධ්‍යාපන අධ්‍යක්ෂ, අධ්‍යාපන අමාත්‍යාංශය, ඉසුරුපාය, බත්තරමුල්ල.

ශාලිකා රංතිලක මිය - කථිකාචාර්ය, මහරගම ජා.අ.වි. පීඨය, මහරගම.

සරසි පීරිස් මෙය - ගුරු වෘත්තික - සබ/ර/ ප්‍රඥාධීර වි, කහවත්ත.

සුභාෂිනී හේරත් මිය - ගුරු වෘත්තික - උමැ/අ/නිවත්තක චෛතිය ම. වි. අනුරාධපුර.

සුරංගි කෝසලා මිය - ගුරු වෘත්තික - බප/පිළි/ පිළියන්දල ම. ම. වි. පිළියන්දල.

සුලෝචනා ප්‍රියදර්ශනී මිය - ගුරු වෘත්තික -මප/නු/ අඹගමුව ම. වි. හැටන්.

# නාට්‍ය පෙළ රචනය

නාට්‍ය පෙළ යනු නාට්‍යයේ එන අවස්ථා, සිදුවීම්, චරිත සහ රංග විධාන ඇතුළත් සාහිත්‍යමය ලියවිල්ලයි. මෙය නාට්‍ය පිටපත ලෙසින් ද හඳුන්වනු ලැබේ.



නාට්‍ය පෙළක් ලිවීම සඳහා යම්කිසි සිදුවීමක් හෝ කතා ප්‍රවෘත්තියක් පදනම් කර ගනියි. එය යම්කිසි කතාන්දරයකින්, ප්‍රවෘත්තියකින්, තමන් මුහුණ දෙන සිදුවීමකින්, නවකතාවකින්, කෙටිකතාවකින් හෝ වෙනත් ඕනෑම ආකාරයකින් අප දැන ගන්නා දෙයක් විය හැකිය. නමුත් අප නාට්‍ය පෙළ රචනයේ දී එම කතා ප්‍රවෘත්තියේ මුල,මැද සහ අග ඒ අනු පිළිවෙලින්ම තිබිය යුතුයැයි නියමයක් නැත. රචකයාට අවශ්‍ය කොටස් පමණක් තෝරා ගන්නා අතර එහිදී ඔහුට අවශ්‍ය පරිදි සිද්ධි ගලපා ගනු ලබයි. එසේ නාට්‍යයක සිද්ධි ගලපන පිළිවෙල නාට්‍යයක කතා වස්තුව නම් වේ.

යම් කතාන්දරයක එන අදහස ඇතැම්විට පෙළ රචනයේ දී වෙනස් වේ.

> උදා.- චුල්ල ධනුද්ධර ජාතකයේ දී කියැවෙන්නේ ස්ත්‍රියගේ චපල බව ය. නමුත් මනමේ නාටකයේ දී පෙන්වා දෙන්නේ අනපේක්ෂිත මොහොතකට මුහුණ දෙන ස්ත්‍රියකගේ හැසිරීමේ ස්වභාවය ය. මනමේ නාට්‍ය පෙළ රචනයේ දී රචකයා ස්ත්‍රිය දෙස මානුෂවාදී බැල්මක් හෙලා ඇත.

**චුල්ල ධනුද්ධර ජාතකයේ එන කතා පුවත**

යටගිය දවස බරණැස් නුවර බරණැස් නුවර බඹදත් රජු රජ කරන කාලයෙහි එක්තරා බමුණු කුමරෙක් දිසාපාමොක් ඇදුරුතුමන් සමීපයෙහි ශිල්ප උගත්තේය. දිසාපාමොක් ආචාරීහු ශිල්ප නිමවූ කුමරුන්ට චුල්ල ධනුද්ධර යැයි නම් තබා සිය වැඩිමහල් දියණිය ද සරණ පාවා දුන්නෝ ය.

චුල්ල ධනුද්ධර කුමරු ඊතල පන්සියයක් ද සහිත ව පංචායුධයෙන් සැරසී සිය බිරිඳ සමඟ යන අතර තුර වනාන්තරයට පිවිසෙයි. එහිදී තමන් ඉදිරියට එන දරුණු හස්තියෙකු එක් හී තලයකින් විද මරයි.

අනතුරුව අනෙක් වනාන්තරයක දඩමස් පුළුස්සා කන සොරුන් පන්සියයක සමූහයක් දැක මස් ඉල්ලාගෙන ඒමට සිය බිරිඳ ඔවුන් වෙත යවයි. සොරුහු අමු මස් දෙති. කුමරු අමුමස් ආපසු දී පිළිස්සූ මස් ගෙන ඒමට නැවත සිය බිරිඳ පිටත් කරයි. ඉන් කෝපයට පත්වන සොරුන් ධනුද්ධර කුමරු සමග සටනට එළඹේ. කුමරු සොරුන් 499 ක් තමා ලඟ ඉතිරි ඊතල වලින් විද මරා දමයි. අවසානයේ ඉතිරිවන සොර දෙටුවා සමග ද්වන්ධ සටනක යෙදෙයි. සටන අතර මැද සොර දෙටුවාව යටපත් කරගන්නා කුමරු ඔහු නසා දැමීමට සිය බිරිඳගෙන් කඩුව ඉල්ලා සිටියි. එහිදී ඇය සොරදෙටුවාට කඩුවේ මිටත් කුමරුට කඩු කොපුවත් ලබා දෙන අතර සොර දෙටුවා කුමරුව මරා දමයි. තනිවූ ධනුද්ධර කුමරුගේ බිරිඳ සමග

ගහක් සමීපයට එන සොර දෙටුවා මැයගෙන් තමාටද එබඳුම ඉරණමක් අත්වේයැයි සිතා ඇගේ ආභරණ ද රැගෙන පලා යයි.

මෙම සිදුවීම දකින ශක්‍ර දෙවියන් පංචශිඛ සහ මාතලී දිව්‍ය පුත්‍රයා කැඳවයි. පංචශිඛ උකුසු වෙසක් ද මාතලී මත්ස්‍ය වෙසක් ද තමන් කැනහිල් වෙසක් ද ගෙන ඇය ඉදිරියේ සිදුවීමක් මවයි. කැනහිලා මස් කැටියක් ගෙන ඇය ඉදිරියේ පෙනී සිටියි. එවිට මත්ස්‍යයා දියෙන් ගොඩට පනියි. ඒ දකින කැනහිලා මස් කැටිය අතහැර මත්ස්‍යයා වෙතට දුවයි. ඒ අතර උකුස්සා මස් කැටිය පැහැර ගනියි. මත්ස්‍යයා ද නැවත දියට පනියි. කැනහිලාට මත්ස්‍යයාත් මස්කැටියත් දෙකම අහිමි වෙයි. මෙය බලා සිටින බිසවට සිනහ යයි. කැනහිලා සිනාසීමට හේතු විමසයි. කටින් ගෙන ආ මස් කැටියත් මාළුවාත් දෙදෙනාම අහිමි වූ අයුරු දැක සිනාසුන බව කී කල්හි බිසවටත් සැමියා සහ සොර දෙටු යන දෙදෙනා ම අහිමි වූ බව පෙන්වා නින්දා කර ඊට හේතු දක්වා පතිව්‍රතා ධර්මය ආරක්ෂා කරන ලෙස දන්වා පිටව යයි.




**මනමේ නාට්‍යයේ එන සිදුවීම්**

- බරණැස් පුර රජුගේ පුත් ශිල්ප නිමවා සිය රට බලා යාමට පැමිණීම.
- දිසාපාමොක් ඇදුරුතුමා කුමරුට ධනුද්ධර යන නාමය ලබා දී සිය දියණිය ද සරණපාවා දීම.
- කුමරා සහ කුමරිය වනයේ සිරි නරඹමින් ගමන් කිරීම.
- අතරමගදී වැදි පිරිසක් පැමිණ පිටව යාම.
- ඔවුන්ගෙන් අනතුරක්වේදැයි කුමරිය බියපත්වීම.
- වැදි පිරිස නැවත පැමිණීම සහ වැදිරජු කුමරිය තමා වෙත රඳවා පිටත්වන ලෙස කුමරුට දැන්වීම.
- වැදි රජු සිය පිරිස පිටත් කර මනමේ කුමරු සමග සටනක යෙදීම.
- වැදි රජුව යටපත් කරගන්නා කුමරු ඔහු මරා දැමීමට කුමරියගෙන් කඩුව ඉල්ලීම.
- වැදි රජුට සමාව දෙන ලෙස කුමරිය ඉල්ලා සිටීම.
- එම අවස්ථාවේදී වැදි රජු කඩුව උදුරාගෙන කුමරුන්ව මරා දැමීම.
- අසරණ වූ කුමරිය තමන් ට වැදි රජු කෙරෙහි ප්‍රේමයක් ඇති වී කඩුව ඔහුට දීමට අදහස් කළ බව පැවසීම.
- තමාට ප්‍රේම කළ ස්වාමියාට එවන් අපරාදයක් කිරීමට සිතූ එවැනි ගැහැණියක තමන්ටද එපා යැයි පවසා වැදි රජු පිටව යාම.
- වේදනාවට පත්වන කුමරිය ළය පැලී මිය යාම.

චුල්ල ධනුද්ධර ජාතකයේ කතා පුවත සහ මනමේ නාට්‍යයට යොදාගෙන ඇති සිදුවීම් දෙස බලන විට රචකයා විසින් කරනු ලබන්නේ කතා පුවතක තොරතුරු ඒ ආකාරයෙන් ම යොදා ගැනීම නොව තමාට

අවශ්‍ය සිදුවීම් නාට්‍යානුකූලව පෙළ ගැස්වීම බව ද කතා පුවතේ තොරතුරු තමාට අවශ්‍ය ආකාරයට සකස් කරගන්නා බව ද මෙයින් පැහැදිලි වේ. මෙහිදී රචකයා නාට්‍යයේ සිදුවීම් ස්ථාන දෙකකට සීමා කරගෙන ඇත.

**නාට්‍ය පෙළක් රචනා කිරීමේ දී පහත පියවරයන් අනුගමනය කිරීම වඩාත් සුදුසු වේ.**

- තෝරාගත් කතා පුවත නාට්‍ය රචනයට ගැලපෙන ආකාරයට අවස්ථාවලට වෙන් කර ගැනීම. (ඉහත දැක්වූ චුල්ල ධනුද්ධර ජාතකයේ පරිදි කතා පුවතේ අවස්ථා රැසක් තිබුණ ද පෙළ රචනයේ දී එය අවස්ථා එකකට හෝ දෙකකට සීමා කර ගත යුතුය.)
- මුල,මැද,අග සම්බන්ධය රැකෙන පරිදි අවස්ථා ගළපා ගැනීම.
- නාට්‍යය රචනා කරන ශෛලිය තීරණය කිරීම.
- යම් කිසි ගැටළුවක් නිර්මාණය වන සේ පෙළ රචනා කිරීම.
- සිදුවීම් මගින් ආරම්භක ගැටළුව උච්ඡ අවස්ථාවක් සහ අවසානයක් ගොඩ නැගෙන ලෙස නිර්මාණය කිරීම.
- චරිත, රංග විධාන සහ සංවාද පැහැදිලි වන සේ රචනා කිරීම.
  රචකයාගේ අදහස අධ්‍යක්ෂවරයාට සහ නළු නිළියන්ට පැහැදිලිව තේරුම් ගැනීම සඳහා රංග විධාන පැහැදිලිව ලිවීම අත්‍යාවශ්‍ය ය.

  උදා.- ජයලත් මනෝරත්නයන්ගේ "තලමල පිපිලා" නාට්‍යයේ පහත දෙබසේ එන සාහිත්‍යමය ගුණය සහ රංග විධාන මගින් කෙරෙන පැහැදිලි කිරීම් විමසා බලන්න.

  රංබරණා - මටනම් මොකුත් ම හිතාගන්ට බෑ ගුණවංශ.

  ගුණවංශ - හිතා ගන්ට බෑ නෙවී. හිතා ගන්ට පුළුවන් වෙන්ට ඕනැ. හිත දූර්වල කරගන්ට එපා. (ඔහු වඩාත් රංබරණාට සමීප වේ.) මේක පුංචි රටක්... අපි ආයෙත් කොහේදි හරි මුණ ගැහේවි. මං ගැන කාටවත් කියන්ට ඕනැ නෑ... දැන් ඉතිං වෙලාව හරි. (පිටතින් අඩි ශබ්දයක් ඇසේ.) ඕ දැනටමත් වෙලාව පරක්කුයි. මම මේ පැත්තෙන් පැනගන්නං. (ගුණවංශ වහා පිටවෙයි.)

  රංබරණා - ගුණවංශෙ... ගුණවංශෙ...
  (රංබරණා දූර්මුඛ විලාසයෙන් ආපසු හැරෙයි.)

- සංවාද මගින් චරිතයේ වයස, තරාතිරම සහ චරිත ස්වභාවය හෙලි විය යුතු ය.

තෝරා ගත් කතා පුවතින් ප්‍රකාශ වන අදහසට වඩා වෙනත් අදහසක්, අර්ථයක් මතු වන පරිදි කතා පුවත නිර්මාණය කිරීම වඩාත් සාර්ථක රචකයකුගේ ලක්ෂණයකි. මූලික කතා පුවත වෙනස් කරමින් නව අර්ථකථනයක් ඉදිරිපත් කිරීමට පෙළ රචනයේ දී උත්සාහ කළ යුතු ය.

උදා. - මහාවංශයේ එන යසලාලක තිස්ස රජුගේ කතාව ඇසුරෙන් සයිමන් නවගත්තේගම මහතා නිර්මාණය කළ සුබ සහ යස නාට්‍යය ඉතිහාස කතාවකට නව අර්ථකථනයක් දුන් විශිෂ්ට නාට්‍ය පෙළක් සේ හැඳින්විය හැකි ය. ඉතිහාස කතාවට අනුව යස රජු අනුවන, ස්ත්‍රී ලෝලී සහ සුරා ලෝලී රජෙකි. නමුත් නවගත්තේගමයන් සිය නාට්‍ය තුළ දී ජීවිතය පිළිබඳ විනිවිද දකින රජෙකු සහ දේශපාලනයේ ස්වභාවය පිළිබඳව හෙළිකරමින් නව අර්ථකථනයක් ඉදිරිපත් කරයි.

එක් එක් නාට්‍යයේ ස්වභාවය අනුව කතාව ගොඩ නැගෙන ආකාරය වෙනස් වේ. නිදසුනක් ලෙස දිගු නාට්‍යකරුවාට ඇති නිදහස කෙටි නාට්‍යකරුවාට නැත. කෙටි නාට්‍යකරුවා නාට්‍ය රචනයේ සිට ම සංක්ෂිප්ත බව කෙරෙහි අවධානය යොමු කළ යුතු ය. එමෙන් ම යතාර්ථවාදී රංග රීතිය, අධි යතාර්ථවාදී රංග රීතිය, අසම්මත රංග රීතිය ආදී වශයෙන් නාට්‍ය නිර්මාණය කිරීමට බලාපොරොත්තු වන රංග රීතිය අනුව ද පෙළ රචනයෙහි ස්වභාවය වෙනස් වේ.

ඇගයීම :

1. නාට්‍ය පෙළක් යනු කුමක් ද?
2. නාට්‍ය පෙළක් රචනා කිරීම සඳහා අත්දැකීම් ලබා ගත හැකි ක්‍රම පහක් සඳහන් කරන්න.
3. නාට්‍ය පෙළක් රචනා කිරීම සඳහා සුදුසු අප එදිනෙදා ජීවිතයේ දකින සිදුවීම් පහක් දක්වන්න.
4. ඉහත දක්වන ලද සිදුවීමක් පාදක කරගෙන නව අර්ථකථනයක් මතු වන සේ නාට්‍ය පෙළක් රචනා කරන්න.

# තෝරා ගෙන නළු නිළියන් හැඩ කරමු සිත සතුටින්

## නළුනිළියන් තෝරා ගැනීම හෙවත් නළුවරණය

නිර්මාණය කරන ලද නාට්‍ය පෙළෙහි ඇතුලත් චරිත සඳහා ඒ ඒ කුශලතා පිරිපුන් නළුවන් සහ නිළියන් තෝරාගත යුතුය. නාට්‍ය පිටපතේ අඩංගු චරිත සඳහා ගැළපෙන නළු නිළියන් තෝරා ගැනීම නළුවරණය යනුවෙන් හැඳින් වේ.

අධ්‍යක්ෂවරයාට නළු නිළිවරණයේ දී ප්‍රවීන නළුනිළියන් හෝ ආධුනික නළු නිළියන් තෝරා ගැනීමේ හැකියාව ඇත. එහි දී ප්‍රවීන නළු නිළියන් පිටපතට අදාල චරිතවලට සුදුසු පරිදි පෙර අත්දැකීම් පදනම් කර ගෙන පහසුවෙන් තෝරා ගත හැකි අතර ආධුනික නළුවෙක් හෝ නිළියක් තෝරා ගැනීමේ දී පෞරුෂය, කට හඬ, ගායන නර්තන හැකියාව, ශරීර ස්වභාවය, බුද්ධිය ආදී කරුණු කෙරෙහි අවධානය යොමු කරමින් පරීක්ෂණයක් පවත්වා තෝරා ගත හැක. මෙය පිටපතේ ඇති චරිතවල ස්වභාවය අනුව සිදු කර ගත යුතුය.

ප්‍රවීන නළුවරණය ඔවුන්ගේ පෙර රංගන කුසලතා මගින් කළ හැක





එනම් මෙහි දී නාට්‍ය අධ්‍යක්ෂවරයාට තම පිටපතට අදාලව චරිත සඳහා නළුවරණයේ දී නළුවා හෝ නිළිය ගේ ප්‍රතිභාපූර්ණ රංග විලාසය ඔවුන් ගේ පෙර රඟපෑම් නරඹා වටහා ගත හැක. පිටපතෙ හි ශෛලියට අනුව නාට්‍යධර්මී නාට්‍යන්හි නිපුණ නළුනිළියන් හෝ ලෝකධර්මී නාට්‍යන් හි නිපුණ නළුනිළියන් තම අවශ්‍යතාවය අනුව වරණය කළ හැක. නාට්‍යධර්මී නාට්‍ය තුළ රිද්මයානුකූල, තාලානුකූල රංගන රටා බහුල බැවින් ඒ සඳහා ගායන, නර්තථන හැකියාව ඇති නළුනිළියන් පෙර කුසලතා අත්දැකීම් හරහා තෝරා ගත හැක. එමෙන්ම චරිතවලට අදාල බාහිර ස්වරූපයන්(උස, මහත,වයස) හා ගති ලක්ෂණ සඳහා උචිත නළුනිළියන් ද එහිදී පහසුවෙන් තෝරා ගැනීමේ හැකියාව එහි දී තිබේ.

ආධුනික නළුවරණයට එම මොහොතේ කුසලතා මැන බැලිය හැක





**එනම් මෙහි දී නවක නළුනිළියන් පිටපතෙහි ඇති චරිත සඳහා තෝරා ගැනීමක් සිදු කරයි. එවිට එම ශිල්පීන් පළමුව බාහිර වශයෙන් චරිතයට සුදුසු දැයි තෝරා ගත හැක. අනතුරුව ඔවුන් ගේ රංගන කුසලතාව මැන බැලීම සඳහා සුදුසු ක්‍රමයක් යොදා ගත හැක. මෙහි දී නාට්‍යයේ ශෛලිය අනුව කුසලතා මැන බැලිය හැක. එනම් පිටපතෙහි ගායන, නර්තන කොටස් අඩංගු වී ඇත්නම් ගායනා කරමින් නර්තනයේ හෝ රංගනයේ යෙදීමට ලබා දීම, නාට්‍යයක දෙබස් ඛණ්ඩයක් රඟපෑමට අවස්ථාව දීම (මෙහි දී අදාල පිටපතෙහි සුදුසු දෙබස් ඛණ්ඩයක් ලබා දීම ද සිදු කළ හැක). තව ද ක්ෂණික නිරූපණයක් ලබා දීම මඟින් රංගන කුසලතාව, නිර්මාණශීලී බව හා පරිකල්පනය මැන බැලිය හැක.**

**නාට්‍යයක් සාර්ථක වීමට ඒ සඳහා යොදා ගන්නා ආනුෂංගික කලාවන් හි මනා සුසංයෝගයක් තිබිය යුතුය. ආනුෂංගික අංග සැලසුම් කිරීමේ දී නාට්‍ය පෙළට ගැලපෙන ලෙස චරිත පිළිබඳ අවබෝධයෙන් එය සිදු කළ යුතුය. එමෙන් ම අංග රචනය, වේෂභූෂණ, ආලෝකකරණය හා පසුතල සැලසුම් කිරීමේ දී වර්ණ සංයෝජනය පිළිබඳ අවබෝධය ඉතා වැදගත් වේ.**

## <u>වේෂභූෂණ භාවිතය</u>

නාට්‍ය පෙළෙහි දැක්වෙන චරිත සඳහා වේෂභූෂණ නිර්මාණය කිරීම ද අවශ්‍ය වේ. මෙහි දී නාට්‍ය ශෛලිය, යුගය, දේශය, චරිත ස්වභාවය, වර්ණ මෙන්ම රංගනයේ පහසුව ද සලකා බැලිය යුතුය. පිටපතට අදාලව එය නාට්‍යධර්මී නාට්‍යයක නම් ස්වභාවිකත්වයෙන් එහා ගිය වේෂභූෂණත්, ලෝකධර්මී නාට්‍යයක නම් ස්වභාවිකත්වයට සමීප, අප එදිනෙදා භාවිතා කරනා ආකාරයට වේෂභූෂණ සකසා ගත හැක. මිනිස් චරිත, සතත්ව චරිත, අධි මානුෂීය චරිත ආදිය පිළිබඳ අවබෝධයෙන් වර්ණ පිළිබඳව මෙන්ම ඒවා සැකසීමට භාවිතා කරන අමු ද්‍රව්‍ය පිළිබඳව ද විශේෂ අවධානයක් යොමු කළ

යුතුය. රංගනයට පහසුවන ආකාරයට නිර්මාණය කළ යුතු අතරම ඒ සඳහා යෙදවිය හැකි ප්‍රතිපාදන පිළිබඳව ද අවබෝධයකින් සිදු කළ යුතුය.

තව ද මේවා නිර්මාණයට ප්‍රථමයෙන් ඇඳ වර්ණ යොදා සැලසුම් සකස් කර ස්ථිර කර ගත යුතුය.






නාට්‍යධර්මී නාට්‍යයක චරිතයක් සඳහා

ලෝකධර්මී නාට්‍යයක චරිතයක් සඳහා

රූප සටහන්වල දැක්වෙන පරිදි පිටපතට අදාලව චරිත සඳහා වේෂභූෂණ සැලසුම් නිර්මාණය කරගත හැක. නිර්මාණය කිරීමට අභිමත පරිදි වර්ණ යොදා පෙර සැලසුම් කර ගැනීම තුළින් වඩාත් පහසුවෙන් හා නිවැරදිව වේෂභූෂණ සකසා ගත හැකිය.






වේෂභූෂණ සැලසුම් කිහිපයක්

විවිධ නාට්‍ය නරඹමින්, නාට්‍ය නිර්මාණයන් හි ඡායාරූප නරඹමින් නාට්‍ය පෙළට අදාලව වේෂභූෂණ සකසා ගන්නා ආකාරය පිළිබඳ අවබෝධය වැඩි කර ගත හැක.




- **නරි බෑණා නාට්‍ය**

දයානන්ද ගුණවර්ධන මහතා ගේ නරි බෑණා නාට්‍යයෙහි නරියා ගේ චරිතය නිර්මාණය කර ඇති ආකාරය මඟින් ශෛලිගත ආකාරයකුත් ගම දුව ගේ වේෂභූෂණ මඟින් ස්වභාවිකත්වයට සමීප බවත් පෙනේ.




- **විකෘති නාට්‍ය**

සෝමලතා සුබසිංහ මහත්මිය ගේ විකෘති නාට්‍යයෙ හි වේෂභූෂණ අපට එදිනෙදා සමීප අයුරින් ස්වභාවිකත්වයට සමීපව නිර්මාණය කොට තිබේ.




- මනමේ නාට්‍ය

එදිරිවීර සරච්චන්ද්‍ර මහතා ගේ මනමේ නාට්‍ය නාට්‍යධර්මී නාට්‍යයක් බැවින් වේෂභූෂණ ශෛලිගත ආකාරයට ඓතිහාසිකමය ස්භාවයකින් නිර්මාණය කර ඇත.




- තොප්පි වෙළෙන්දා නාට්‍ය

**සෝමලතා සුභසිංහ මහත්මිය ගේ තොප්පි වෙලෙන්දා නාට්‍යයෙ හි වඳුරන් ගේ චරිත සඳහා ස්වභාවිකත්වය ඉක්ම වූ සත්තව චරිත සඳහා උචිත අයුරිනුත් වෙළෙන්දා සඳහා ස්වභාවික ලෙසිනුත් වේෂභූෂණ නිර්මාණය කර ඇත.**

## <u>අංග රචනා සැලසුම් කිරීම</u>

නළුවා ගේ රංගන කාර්යයේ දී අර්ථ නිරූපණය සාර්ථක වීම සඳහා අංග රචනා විශාල පිටිවහලක් වේ. එබැවින් නාට්‍ය ශෛලියට අනුකූලව චරිත ස්වභාවයන් සලකා බලා අංග රචනා කළ යුතුය. භාවිත කරන උපකරණ පිළිබඳ මෙන්ම අංග රචනා මූලධර්ම පිළිබඳ අවබෝධයෙන් කටයුතු කළ යුතුය.

 

අංග රචනයේ දී ද පූර්ව සැලසුම් සකසා ගැනීම වැදගත් වේ.








සත්ත්ව චරිත සඳහා අංග රචනා සැලසුම්






වයස් ගත චරිතය අංගරචනයට සැලසුම් කිරීමේ දී

මේ අයුරින් මුහුණ කොටස් වලට බෙදා ගත හැක

නාට්‍යයක මිනිස්, සත්ත්ව හෝ මන මනඃකල්පිත චරිත දැක ගත හැක. අංගරචනය සඳහා එම චරිත ස්වභාවය මෙන්ම ස්ත්‍රී පුරුෂ බව, මුහුණේ හැඩය, වයස, සමේ වර්ණය ආදිය ද බලපායි. චරිතය අනුව සිදු කළ යුතු අංග රචනා වෙනස් වේ. ශෛලිය අනුව එය,

1. සරල අංග රචනය - මෙහි දී පුද්ගලයා ගේ බාහිර ස්වරූපය ඒ අයුරින්ම ඉදිරිපත් කරයි.
2. චරිතාංග අංග රචනය - චරිතයට අදාලව පුද්ගලයා ගේ බාහිර ස්වරූපය වෙනත් අයුරකින් රචනා කරයි.

මේ අයුරින් පිටපතේ ශෛලිය හා චරිතවල ස්වභාවයන් අනුව අංගරචනයේ යෙදිය හැක. (අංග රචනා උපකරණ හා අංග රචනය පිළිබඳ 10 වන ශ්‍රේණියේ අංග රචනා පාඩම අධ්‍යයනයෙන් වැඩිදුර කරුණු අවබෝධ කර ගත හැක.)

විවිධ නාට්‍ය නිර්මාණ නැරඹීම තුළින් හා ඡායාරූප මඟින් නාට්‍ය ශෛලිය හා චරිත ස්වභාවය අනුව අංග රචනය සිදු කළ යුතු අයුරු පිළිබඳ අවබෝධය වැඩි කර ගත හැක.



මෙහි සිංහයා ගේ චරිතය සඳහා යොදා ගෙන ඇත්තේ චරිතාංග අංග රචනයකි. වර්ණ කිහිපයක් යොදා ගනිමින් සත්ත්ව චරිත නිරූපණයකට අදාලව ස්වභාවිකත්වය ඉක්මවා ගිය අංග රචනයක් යෝදා ගෙන තිබේ.



මෙහි දී සිදු කර ඇත්තේ ද පුද්ගලයා ගේ බාහිර ස්වරූපය වෙනස් කරමින් චරිතාංග අංග රචනයකි. ශිල්පිනිය ගේ පෙනුම වඩා වයස් ගත අයුරින් අංගරචනා කොට ඇත.









මෙහි පළමු රූපයේ ද කොටියෙකු ගේ මුහුණක් ආකාරයට සත්ත්ව චරිතයකට අදාල චරිතාංග අංගරචනයක් සිදු කොට තිබේ. දෙවන රූපයේ ස්වභාවික ආකාරයට සරල අංග රචනයක් හා වයස් ගත පෙනුම ලබා ගැනීමට සුදුසු පරිදි ඇතැම් චරිත සඳහා චරිතාංග අංග රචනා භාවිතා කර ඇත. තෙවන රූපයේ සිටිනා ප්‍රවීන රංගන ශිල්පිණී අනුලා බුලත්සිංහල මහත්මියට යොදා ඇත්තේ බාහිර ස්වරූපය ඒ අයුරින් ඉදිරිපත් කර යොදා ඇති සරල අංගරචනයකි.

ඇගයීම: 1. ඔබ නරඹා ඇති නාට්‍ය ඇසුරින් මිනිස් චරිතයක් හා සත්ත්ව චරිතයක් තෝරා ගෙන සුදුසු පරිදි වේෂභූෂණ සැලසුම් කරන්න.

2. එම චරිත සඳහා අංග රචනා සැලසුම් කරන්න.

# <u>වේෂභූෂණ නිර්මාණය කිරීම</u>

වේෂභූෂණ නිර්මාණයේ දී නාට්‍ය පෙළෙහි ශෛලිය විමසා බැලිය යුතුය.

- එම නාට්‍ය පෙළ ලෝක ධර්මී රංග ශෛලියට අයත් නම් නිර්මාණය කරනු ලබන වේෂභූෂණ සාමාන්‍ය ජීවිතයේ අඳින පළඳින ආකාරයට සමීප අයුරින් වේදිකාවට සරිලන ලෙස සකස් කළ යුතුය.



කැළණි පාලම නාට්‍යය




තලමල පිපිලා නාට්‍යය

- එම නාට්‍ය පෙළ නාට්‍යධර්මී රංග ශෛලියට අනුව සකස් කරන ලද්දක් නම් නිර්මාණය කරනු ලබන වේෂභූෂණ ස්වභාවිකත්වයෙන් ඈත්ව කාල්පනිකත්වයෙන් සහ අතිශයෝක්තියෙන් යුක්තව නිර්මාණය කළ යුතුය.




රත්නාවලී නාට්‍යය



මනමේ නාට්‍යය

- නළුවා ගේ බාහිර සමාරෝපයටත්, අභ්‍යන්තර සමාරෝපයටත් වේෂභූෂණ ඉතා වැදගත් වේ. වේෂභූෂණ මඟින් දුටු පමණින් අපට චරිත හඳුනා ගැනීමේ හැකියාව ඇත. එමෙන්ම නළුවෙකුට හෝ නිළියකට තම චරිතයට අදාලව වේෂභූෂණවලින් සැරසීම මඟින් චරිතයට අභ්‍යන්තරිකව පිවිසීමේ උත්තේජනයක් ලැබේ. අප එදිනෙදා ජීවිතයේ දී වුව ද අවස්ථානුකූලව ඇඳුම් පැළඳුම් වෙනස් කරන විට ද මෙකී කාරණය අවබෝධ කර ගත හැක.

උදාහරණ - පාසල් යන විට සිසු සිසුවියන් සුදු ඇඳුමින් සැරසීම

පන්සල් යන විට සුදුසු පරිදි සුදු පැහැ චාම් ඇඳුමකින් සැරසීම

මෙහි දී එම ඇඳුම්වලින් සැරසුණු විට අප ගේ භූමිකාව වෙනස් වන අතර අභ්‍යන්තරිකව එම චරිතයට ප්‍රවිශ්ට වී එහි ගති ලක්ෂණ විදහා පාන බව වටහා ගත හැක. අවස්ථානුකූල හැසිරීම්, ගමන බිමන, කතා බහ පවා වෙනස් වන බවත් එය එකිනෙකාට සාපේක්ෂ වුව ද බොහෝ සමාන ලක්ෂණ ඇති බවත් පෙනේ.

- වඩාත් උචිත ලෙසින් වේෂභූෂණ නිර්මාණය කිරීම නාට්‍යයේ සාර්ථකත්වයට හේතු වේ. ඒවා සැහැල්ලු ලෙස මෙන් ම ආලෝකකරණයේ දී ප්‍රේක්ෂකයාට මනා ප්‍රේක්ෂාවක් ලබා ගැනීමට බාධාකාරී නොවිය යුතුය. එනම් ඇසට අපහසුවක් නොවන පරිදි මෙන් ම නළුවා ගේ රූපණය පරයා යන ආකාරයෙන් නිර්මාණය නොකල යුතුය.

උදාහරණ ලෙස, බොහෝ දිලිසෙන වස්ත්‍රාභරණ වේදිකා ආලෝකය මත පතිත වීමේ දී ප්‍රේක්ෂාවට බාධා වේ. සැහැල්ලු රෙදි වර්ග හා අමුද්‍රව්‍ය යොදා ගනිමින් නිර්මාණය කළ යුතුය. ( කොටන්, වොයිල්, සෙටින්, කාඩ්බෝඩ්, රේන්ද, පබළු ආදිය මේ සඳහා යොදා ගත හැක.)

- නළුවෙකු නිරූපණය කරන භූමිකාව පිළිබඳ දෘශ්‍ය සංඥා රැසක් එම නළුවා ගේ වේෂභූෂණයෙන් අනාවරණය වේ.

පොලිස් නිලධාරියෙකු, හෙදියක, වෛද්‍යවරයෙකු මෙන් ම රජ කෙනෙකු ගේ චරිත නිරූපණයක දී වේෂභූෂණ මඟින් ඉතා පහසුවෙන් එම චරිත හඳුනාගත හැක. එමෙන්ම එහි යුගය, දේශය පිළිබඳව මෙන් ම එම චරිතය තුළ ඇති පිළිවෙල හෝ අවුල් සහගත ස්වභාවයන් මඟින් චරිතයේ මනෝ භාවයන් පිළිබඳ සංඥාමය හැඟවීමක් ද ලබා ගත හැක.






- චරිතයක් හඳුනා ගැනීමට, චරිතයක වයස අනාවරණය කර ගැනීමට, රසවින්දනයට, විශ්වාසනීයත්වයට මෙන්ම චරිතයක ගති ලක්ෂණ ඉස්මතු වී පෙනීමට ද වේෂභූෂණය හේතු වේ.
- එමෙන් ම චරිතයක මානසික ස්වභාවය ඉස්මතු කර දැක්වීමට ද වේෂභූෂණ උපකාරී වේ.

මෙහි දී ද පිළිවෙල හෝ අපිළිවෙල මත ,නොමැති නම් වේෂභූෂණ පැළඳ ඇති ආකාරය අනුව චරිතය හොඳ මානසික මට්ටමකින් පසුවනවා ද අවුල් සහගත මානසික මට්ටමකින් පසුවනවා ද යන්න පිළිබඳ වටහා ගත හැකිය.



හුණුවටය නාට්‍යය



හුණුවටය

- නාට්‍ය ශෛලිය හා ඉන් මතු කෙරෙන මනෝභාවය පිළිබඳව වේෂභූෂණ නිර්මාණ ශිල්පියා තුළ අවබෝධයක් තිබිය යුතුය.

- ඓතිහාසික යුගයේ චරිත සඳහා වේෂභූෂණ නිර්මාණය කරන්නේ නම් අදාළ යුගයේ වස්ත්‍රාභරණ පිළිබඳ ව මනා අධ්‍යයනයක් කළ යුතුය.

උදාහරණ,

වර්තමානයේ පටන් අනුරාධපුර, පොළොන්නරු, යාපහු ආදී යුගයන්වල මෙන් ම ගල් යුගය, දඩයම් යුගය ආදි ඈත අතීතයේ දක්වා විමසීමේ දී කලින් කලට ඇඳුම් පැළඳුම්වල වෙනස්කම් හා ආවේණික ලක්ෂණ ඇත. ඒවා දේශීය හා විදේශීය වශයෙන් ද විවිධාකාර වේ. ඒ පිළිබඳ අධ්‍යයනය කරමින් වේෂභූෂණ එම චරිතවලට නිර්මාණය කල යුතුය.



මනමේ නාට්‍යය



සිංහබාහු නාට්‍යය

- රට, ප්‍රදේශය හා සංස්කෘතිය වේෂභූෂණ වලින් පිළිබිඹු විය යුතුය.

විවිධ රටවල් අනුව ද ජාතීන් අනුව ද සංස්කෘතිකමය වශයෙන් ද වේෂභූෂණ වෙනස් වේ. එවිට ඒවාට හානි නොවන ලෙසත් අදාල ලෙසත් නිර්මාණය කර ගත යුතුය.

- ප්‍රධාන වශයෙන් ම පෙළෙහි එන චරිතයන්ට උචිත ම අයුරින් වේෂභූෂණ නිර්මාණය කළ යුතුය.
- නළුවා ගේ රංගන කාර්යයට පහසු ආකාරයෙන් මෙන්ම ඇතැම් විට නාට්‍ය රඟ දැක්වෙන අතරතුර වේෂභූෂණ මාරු කිරීමට ඇත්නම් ඒ සඳහා හැකි වන පරිදි ඒවා නිර්මාණය කළ යුතුය.

උදාහරණ ලෙස,

- පහසුවෙන් මාරු කිරීමට හැකි පරිදි ෂිපර් හෝ වෙල්කො කැබලි යොදා ගැනීම
- එකම ඇඳුමෙහි පැති දෙකම ප්‍රයෝජනයට ගනිමින් චරිත දෙකකට සුදුසු ලෙස ඇඳුම සකසා ගැනීම (කබා වැනි)
- පැළඳ සිටින වේෂභූෂණවලටම තවත් වේෂභූෂණ කොටස් සම්බන්ධ කර ගනිමින් පෙනුම වෙනස් කර ගැනීම (ෂෝල්, කෝට් වැනි)

- වේෂභූෂණ නිර්මාණයේ දී ද වර්ණ පිළිබඳ මනා අවබෝධයෙන් හා වර්ණ පිළිබඳ සැලකිලිමත් විය යුතු අංගරචනා, පසුතල හා ආලෝක යන ශිල්පීන් සමඟ ද සාකච්ඡා කරන්නේ නම් මැනවි. නිර්මාණය කරන වේෂභූෂණ ආලෝකකරණය හමුවේ වෙනස් වීමෙන් චරිතයට මෙන්ම නාට්‍යයෙහි අර්ථ රසයට පවා හානි විය හැක. මේ නිසා වේෂභූෂණ නිර්මාණයට ප්‍රථම ඒ සඳහා සැලසුම් සකස් කිරීමත් සාකච්ඡා කිරීමත් වඩාත් සුදුසු ය. (පෙර පාඩමේ දී කරන ලද සැලසුම් හා අධ්‍යයනයන් වේෂභූෂණ නිර්මාණය කිරීම සඳහා ඉවහල් කර ගත හැක.)







ආලෝකය ද්‍රව්‍ය හා පෘෂ්ඨ මත පතිත වීමේ දී ඒවා යේ වර්ණ පරාවර්තනය වී වෙනස් වේ. ඒ සඳහා ආලෝක වර්ණ සුසංයෝජනය හා පෘෂ්ට වල වර්ණ සුසංයෝජනය බලපානු ලැබේ. එම නිසා වේෂභූෂණ නිර්මාණය කරන විට මෙම වර්ණ ගැලපීම් හා සුසංයෝජන පිළිබඳ මනා අවබෝධයකින් එය සිදු කළ යුතු වේ.

හෙන්රික් ඉබ්සන් ගේ doll’s house නාට්‍යයේ වේෂභූෂණ සැලසුම් කිහිපයක්






නෝරාගේ චරිතය

ලින්ඩේ මිය ගේ චරිතය

ඇගයීම: 1. පහත දැක්වෙන චරිත සඳහා රංග වස්ත්‍රාභරණ ආකෘතීන් නිර්මාණය කරන්න.

- ➢ රජ කෙනෙක් (නාට්‍යධර්මී)
- ➢ දුප්පත් මහළු කාන්තාවක් (ලෝකධර්මී)
- ➢ නරි බැණා නාට්‍යයේ නරියා ගේ චරිතය

(මේ සඳහා රෙදි කැබලි, නූල්, ඉදිකටු, ගම්, කතුරු වැනි පහසුවෙන් සපයාගත හැකි ද්‍රව්‍ය යොදා ගන්න.)

2. ඔබ නරඹා ඇති නාට්‍යයක වේෂභූෂණ නිර්මාණය කර තිබූ ආකාරය පාඩමෙහි කරුණු සැලකිල්ලට ගනිමින් විස්තර කරන්න.

# අංගරචනා කිරීම

- අතීතයේ දී වෙස් මුහුණු භාවිතය නාට්‍ය ඉදිරිපත් කිරීමේ දී වැඩි වශයෙන් යොදා ගත් බැවින් අංගරචනයට ප්‍රධාන තැනක් නොලැබුණ ද වර්තමානයේ දේශීය නාට්‍ය කලාව තුළ මෙන් ම ලොකයේ ද ඉතා දියුණු අංගරචනා ක්‍රම යොදා ගනියි.
- අංගරචනයේ දී  ශෛලිය පිළිබඳ සැලකිලිමත් විය යුතුය. කවර සම්ප්‍රදායේ නාට්‍යයකට වුව ද අංගරචනය යොදා ගනී. ආලෝකකරණයේ දී මුහුණෙ හි හැඩතල ත්‍රිමාණ කර පෙන්වීමට අංගරචනය අවශ්‍යවීම එයට හේතුවයි.
- එමෙන් ම අංගරචනයක් සිදු කිරීමට පෙර පිටපත හොඳින් අධ්‍යයනය කළ යුතුය. එහි කාලය, යුගය, දේශය, සංස්කෘතික පසුබිම ආදී සියලු කාරණා අධ්‍යයනය කිරීමෙන් පසුව අංගරචනය කල යුතුය.
- විවිධ චරිත අනුව කළ යුතු අංග රචනා වෙනස් වේ. අංගරචනය සිදු කරන ප්‍රධාන ක්‍රම දෙකෙන් එකක් ශෛලිය හා චරිත ස්වභාවය අනුව යොදාගනිමින් අංගරචනා කළ යුතුය.

  එනම්, 1. සරල අංගරචනය

  2. චරිතාංග අංගරචනය අනුව යි.

යම් පුද්ගලයෙකු ගේ බාහිර ස්වරූපය ඒ ආකාරයෙන් ම ඉදිරිපත් කරන අවස්ථාවක දී සරල අංගරචනය යොදා ගනී. එනම් චරිතයේ සැබෑ වයස, පෙනුම ඒ ආකාරයෙන් ම චරිතය සඳහා යොදා ගන්නා විටදී ය. බොහෝ විට තරුණියන් සුන්දරත්වය උදෙසා ද සරල අංගරචනයේ යෙදෙති. බොහෝ විට ලෝකධර්මී නාට්‍ය සඳහා යොදා ගන්නේ සරල අංගරචනය යි. නමුත් රංගන ශිල්පියෙකු හෝ ශිල්පිනියක හාත්පසින් ම වෙනස් චරිතයක් නිරූපණය කිරීමේ දී එම චරිතයට අනුකූලවන ආකාරයෙන් නිර්මාණාත්මකව ඔහු හෝ ඇය වෙස් ගැන්වීම චරිතාංග අංගරචනයේ දී සිදු කරයි.

සරල අංගරචනය සිදු කළ අවස්ථා





චරිතාංග අංගරචනා සිදු කළ අවස්ථා









- අංගරචනා කිරීමේ දී අඳුර හා එළිය යන මූලධර්මය යොදා ගනී. විශේෂයෙන් වර්ණ භාවිත කර මුහුණේ ත්‍රිමාණ ලක්ෂණ මතුකොට පෙන්වීම සඳහා මෙම මූලධර්මය ඉතා වැදගත් වේ. අංගරචනයේ දී මුහුණ බෙදෙනා ප්‍රධාන කොටස් වලට මෙම මූලධර්මය යොදා ගනිමින් අවශ්‍ය ලෙස චරිතයේ ස්වරූපය මතු කර ගත හැක. එනම් එම අංග හරහා වයසක බව, තරුණ බව, මානසික ව්‍යාකූලතාව, බුද්ධිමත් බව, කල්පනාකාරී බව, රාගය, සුන්දරත්වය ආදී තත්ත්වයන් ඉස්මතු කර ගත හැක.




මෙහි දී මුහුණේ ගිල්වා පෙන්විය යුතු කොටස් අඳුරු හෙවත් සුදීප්ත කරන අතර ඉස්මතු කර පෙන්විය යුතු කොටස් එළිය හෙවත් දීප්ත කරයි. අඳුරු කිරීමෙන් කෙට්ටු බව, වයස බව ඉසමතු කළ හැකි අතර දීප්තිමත් කර පෙන්වීමෙන් සුන්දරත්වය, තාරුණ්‍යය, පිරිපුන් බව ඉස්මතු කළ හැක.






- අංගරචනය කිරීමේ දී ආලෝකකරණය හා බැඳි න්‍යායන් දැන සිටීම ද වැදගත් ය. එනම් සුදු පැහැය ආලෝකය පරාවර්තනය කරන බව, කළු පැහැය ආලෝකය උරා ගන්නා බව, ඇතැම් ආලෝකයන් වස්තුව අනුව උරා ගත හැකි බව හෝ පරාවර්තනය විය හැකි බව, පරාවර්තන වර්ණ මඟින් වස්තුවේ වර්ණය වෙනස් විය හැකි බව යනාදිය යි.
- චරිතය ජීවත්වන කාලය, දේශය, යුගය, සාමාජික, ආර්ථික, ආගමික හා අධ්‍යාපනික තත්ත්වයන් පිළිබඳ ව මනා අවබෝධයකින් අංග රචනය කළ යුතු වේ.
- චරිතවල බාහිර ස්වරූපයන් පමණක් නොව අභ්‍යන්තර චරිත ලක්ෂණ නිරූපණය කිරීම සඳහා ද අංගරචනය බලපායි. එමෙන් ම පිටපතට අනුව සත්ත්ව චරිත නිරූපණය කිරීමට ඇති

අවස්ථාවල දී සුදුසු පරිදි චරිතාංග අංගරචනය මඟින් නිර්මාණාත්මක අංගරචනයේ යෙදීමට අංගරචනා ශිල්පියාට සිදු වේ.

උදාහරණ,

- නරි බෑණා නාට්‍යයේ නරියා ගේ චරිතය
- සිංහබාහු නාට්‍යයේ සිංහයා ගේ චරිතය



- චරිත නිරූපණය කරන පුද්ගලයා ගේ සමේ වර්ණය, මුහුණේ හැඩය, අංගරචනය සඳහා බලපායි.
- ප්‍රේක්ෂකයාට චරිත හඳුනා ගැනීමට, චරිත පිළිබඳ නළුවා තුළත් ප්‍රේක්ෂකයා තුළත් විශ්වසනීයත්වයක් ගොඩනගා ගැනීමට හැකිවීම, නළුවා හට සමාරෝපය සඳහා උපකාරී වීම, ආලෝකකරණ තත්ත්වයන් යටතේ යටපත් විය හැකි මුහුණේ හැඩතල, ඉරියව් හා ත්‍රිමාණ ලක්ෂණ මතුකර දැක්වීම ආදිය සඳහා අංගරචනය ඉවහල් වේ.

## අංගරචනයක් සිදු කරන ආකාරය

- අංගරචනයේ දී විවිධ ආලේපන ඉතා ප්‍රවේශමෙන් ගැල්විය යුතු වන්නේ සජීව ව නළුවාගේ සම මත ඒවා ආලේප කරන බැවිනි. සමට හානිකර ද්‍රව්‍ය භාවිතය මඟින් විවිධ ගැටලු ඇති විය හැකි බැවින් වෙළඳ පොළෙහි ඇති අනුමත ද්‍රව්‍ය හා උපකරණ පමණක් අංගරචනා සඳහා යොදා ගත යුතුය.

  උදාහරණ-

  මුහුණෙහි පදනම් ආලේපය සඳහා යොදන ද්‍රව්‍ය

  රැවුල හා වෙනත් දේ ඇලවීම සඳහා ස්පිරිට් ගම් භාවිතය

  වර්ණ ගැන්වීම සඳහා lining colours වර්ග භාවිතය

  (අංගරචනා උපකරණ පිළිබඳ 10 ශ්‍රේණියේ අංගරචනය පාඩමෙන් විස්තරාත්මකව අධ්‍යයනය කළ හැක)

- අංගරචනය නියම ආකාරයෙන් සිදු කිරීමට හොඳින් ආලෝකය ඇති ස්ථානයක් තෝරා ගත යුතුය.

- අංග රචනා ද්‍රව්‍ය හා උපකරණ පිළිවෙලකට තබා ගත යුතුය.
- චරිත සඳහා පෙනී සිටින්නන් ද තම මුහුණ හොඳින් පිරිසිදු කොට ගෙන අංගරචනය කිරීම සඳහා පැමිණිය යුතුය.
- අංගරචනා ශිල්පියා ද තම දෑත් පිරිසිදුව තබා ගත යුතුය.
- අංගරචනා කිරීමේ දී නළුනිළියන් ගේ මුහුණේ සියුම් උපාංගයන්ට හානියක් නොවන පරිදි මනා අවබෝධයකින් යුතුව හා ඉවසිලිවන්තව සිදු කළ යුතුය.
- එක් එක් නළුවා ගේ සමේ වර්ණයට ගැළපෙන පදනම් ආලේපය තෝරා මුහුණේ ආලේප කළ යුතුය. මේ සඳහා මෙම පදනම් ආලේපන අංකනය කර ඇති අතර නළුවා ගේ හෝ නිළිය ගේ සමේ වර්ණය අනුව ආලේප කළ යුතු වර්ණයට අදාල අංකය සහිතව ඒවා තෝරා ගත යුතුය.
- පවුඩර් වර්ග ආලේප කිරීමේ දී ස්වභාවික ලෝම සහිත බුරුසුවක් යොදා ගැනීමත්, ක්‍රීම් වර්ග ආලේපයේ දී කෘත්‍රිම කෙඳි සහිත බුරුසුවක් යොදා ගැනීමත් වඩාත් යෝග්‍ය වේ. එමෙන් ම එක් එක් වර්ණයන්ට වෙන වෙන ම බුරුසු භාවිතා කල යුතුය.
- නළලේ සිට නිකට දක්වා අවශ්‍ය ලෙස අංගරචනය කළ යුතුය. එහි දී, eyebrow pencils, eye shadows, mascara, eye liners, lipsticks, lip liners, lining colours යොදා ගත හැක.
- මුහුණේ හෝ ශරීරයේ ඇතැම් තැන්වල විවිධ හැඩ සැකසීමට අවශ්‍ය නම් ඒ සඳහා “ නෝස් පොටී ” යොදා ගත හැක.

උදාහරණ ලෙස - නාසය දිගුකොට පෙන්වීමට
නිකටෙ හි හැඩය වෙනස් කිරීමට
තොල් විශාල කිරීමට හෝ වෙනත් විකෘතිතා දැකිවීමට



- දත් නොමැති බව හෝ දත් දිරා ගිය බව දැක්වීමට අවශ්‍ය නම් “ටූත් එනැමල්” භාවිතා කළ හැක.
- රැවුල් ආදිය  සකස් කිරීම සඳහා “ක්‍රේප් හෙයා” යොදා ගැනීම ද ඇලවීම සඳහා “ස්පිරිට් ගම්” යොදා ගැනීම ද කළ හැක.

- අවශ්‍ය නම් කොණ්ඩය සඳහා “විග් ” වර්ග භාවිත කළ හැක.
- අංගරචනා ද්‍රව්‍ය මුහුණෙන් ඉවත් කිරීම සඳහා “ බේබි ඔයිල් ” භාවිත කළ යුතුය. අංගරචනයක් යෙදීමෙන් පසු ඉතා ඉකමනින් හා නිවැරදි ක්‍රමයට ඒවා ඉවත් කිරීම සිදු කළ යුතුය.

ඇගයීම :

1. සිංහබාහු නාට්‍යයේ සිංහයා ගේ චරිතය ඔබට අංගරචනා කිරීමට ලැබුණහොත් ඔබ එය සිදු කරන ආකාරය උපකරණ පිළිබඳව ද සඳහන් කරමින් පියවර වශයෙන් ලියන්න.
2. අංගරචනය නාට්‍ය නිර්මාණයක දී වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න.